# අධිකරණ අමාත්‍යාංශය

## කම්කරු විනිශ්චය සහා ලේකම් කාර්යාලයේ
## කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම - 2021

අධිකරණ අමාත්‍යාංශය යටතේ කම්කරු විනිශ්චයාධිකාරයන් හි පුරප්පාඩුව පවතින සහකාර ලේකම් තනතුරු 22 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් සපුරාලීන් ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අධිකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කර ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ලේකම්, කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2021.05.03 දින වේ. අයදුම්පත් යොමු කළ හැක්කේ ඒකාබද්ධ සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන්ට පමණි.

**සටහන :** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභාති අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

01. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් අයදුම්පත් කැඳවා, එම අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවාගැනීම් සිදු කරනු ලබයි.

02. **තනතුරේ ස්වභාවය :**

මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ.

03. **වැටුප් පරිමාණය :**

MN-2-2016 රු. 28,940 - 10x300 -11x350 - 10x560 - 10x660 - රු.47,990/-

04. **මූලික සුදුසුකම් :**

ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

05. **තෝරා ගනු ලබන ක්‍රමය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු මත කුසලතා අනුපිළිවෙළ අනුව පවත්නා පුරප්පාඩු වලට බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දීමේ පටිපාටිය, පුරප්පාඩු පවතින කම්කරු විනිශ්චයාධිකාරයන්ගේ තොරතුරු හා ආදර්ශ අයදුම් පත්‍රය අධිකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියේ (www.moj.gov.lk) පළ කර ඇත.

06. ඉල්ලුම් පත්‍රයට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසු ලැබෙන හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රය දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම්පත මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුනු බව දන්වනු නොලැබේ.

සියලුම අයදුම්පත් තමන් දැනට සේවයේ නියුතු ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතු වේ.

07. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අධිකරණ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

08. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

**එම්. එම්. පී.කේ. මායාදුන්නෙ**
**ලේකම්,**
**අධිකරණ අමාත්‍යංශය.**

2021/03/23